කින්නියා ප්‍රාදේශිය සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

---------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2014 පෙබරවාරි 20 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ 2013 සැප්තැම්බර් 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුනි 26 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයෙන් දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2013 දෙසැම්බර් 31 දිනට කින්නියා ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂනය කෙරේ

(අ) වෙළඳ පොළ බදු ලේඛණයේ ශේෂය වූ රු. 4,971,046 මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන ශේෂය වූ රු.4,438,108 සමග සැසඳීමේදී රු.532,848 ක වෙනසක් නිරීක්ෂණය විය. එබැවින් මූල්‍ය ප්‍රකාශයන්හි වෙළඳ පොල බදු එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) කාර්ය මණ්ඩල ණය ලේඛනය අනුව කාර්ය මණ්ඩල ණය ශේෂය රු.428,895 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශයන් අනුව ශේෂය රු.407,895 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රකාශයන්හි කාර්ය මණ්ඩල ණය ශේෂය රු.21,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.83,780 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.549,074 ක් වූ වෙළඳ පොල බදු ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) 2013 ජනවාරි සිට 2013 ඔක්තෝබර් දක්වා කාලය තුල මිලදී ගත් රු.69,920 ක් වූ පුස්තකාල පොත් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

සේවය හැර ගිය හෝ වෙනත් ආයතනයන්ට මාරු කරන ලද නිලධාරීන් ගෙන් 2006 සිට අයවිය යුතු රු.137,749 ක් වූ හිඟ ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු.000 | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 1,441,311 | ඉඩම් හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර සූත්‍ර | 1,308,525 | ස්ථාවර වත්කම් ලේඛණය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු | 683,720 | |
| මෝටර් වාහන | 3,029,710 | |
| ලැබිය යුතු අත්තිකාරම් | 173,544 | අත්තිකාරම් ලේඛණය සහ කාල විශ්ලේෂණය |
| බදු තැන්පතු | 453,175 | බදු ලෙජරය |
| ණය හිමියෝ | 27,806 | ණයහිමි ලෙජරය |

1.3.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) රීතිය | - | ප්‍රාදේශිය සභා සීමාව තුල පිහිටි ඉඩම් සඳහා නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකම මත බදු පනවා අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ආ) ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන ) රීති - 1988 | | |
| i. VII පරිච්ඡේදයේ රීති අංක 158 | - | සමාලෝචිත වර්ෂය තුල සමුච්චිත වියදම් පිළිබඳ මාසික සාරාංශ පිළියෙල කර නොතිබුණි. |
| ii. VII පරිච්ඡේදයේ රීති අංක 104 | - | ලේකම්වරයා හෝ බලය පැවරූ නිලධාරියෙකු හෝ දිනපතා ගිණුම් ලේඛණ පරීක්ෂා කර කෙටි අත්සන් යොදා නොතිබුණි. |
| iii. VII පරිච්ඡේදයේ රීති අංක 165 | - | සමාලෝචිත වර්ෂය තුල ප්‍රධාන ලෙජරය පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| මුදල් රෙගුලාසි අංක 880 | - | මුදල් සහ ගබඩා භාරව සිටින නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ආරක්ෂණ ඇප ලබාගෙන නොතිබුණි. |

(ඇ) නැගෙනහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි

---------------------------------------

i. රීති අංක 131(3) - ආදායම් සම්බන්ධයෙන් වටිනාකම රු.3,370,974 ක් වූ උප පත්‍රිකා පොත් නැතිවීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරින්ට එරෙහිව පියවර ගෙන නොතිබුණි.

ii. රීති අංක 187(2) - සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු.2,106,258 ක්වූ වවුචර් 68 නැතිවී තිබූ නමුත් යොමුගත රීතියේ පරිදි අදාළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.

(ඉ) අංක: අයිඒඅයි/2002/02 සහ 2002 නොවැම්බර් 28 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය - පරිගණක කොටස් සහ පරිගණක මෘදුකාංග සඳහා වෙනම ලේඛණයක් පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.203,899 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.141,236 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------------

2.2.1 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

----------------------------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ සමුච්චිත ආදායම පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනෙන් සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| i. | වරිපණම් සහ බදු | 35,000 | - | 35,000 |
| ii. | කුලී | 1,466,000 | 509,802 | 956,198 |
| iii. | සේවා ගාස්තු | 509,450 | 301,860 | 207,596 |
| iv. | වෙනත් ආදායම් | 9,592,855 | 10,187,862 | (595,007) |

2.2.2 විදුලි සංදේශ කුළුණු ගාස්තු

සභා සීමාව තුල ස්ථාපිත කර ඇති විදුලි සංදේශ කුළුණු 06 ක් සඳහා ගාස්තු අයකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සභාවට වාර්ෂිකව රු.18,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වලින් ලැබුණු මෝටර් වාහන 13 ක් පසුගිය වසර 08 ක කාලයත් තිස්සේ අගය කර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) 1991-2013 දක්වා කාලපරිච්ඡේදය තුල බැහැර දීමේ පුස්තකාල පොත් 1167 ක් සාමාජිකයන්ගෙන් ආපසු ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2013 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ දැක්වුණු වට්ටෝරු භාණ්ඩ 138 ක් සහ පුස්තකාල පොත් 227 ක් වූ ඌනතා සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) රු.527,701 ක් වූ සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් සහ රු.60,181 ක් වූ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් අදාළ අරමුදල් වලට ප්‍රේෂණය කර නොතිබූ අතර 2006 වර්ෂයේ සිට තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ඉ) රු.2,507,805 ක් වූ වැන්දඹු සහ අනත්දරු දායක මුදල් වර්ෂ 07 කට අධික කාලයක් තිස්සේ නිරවුල් කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ

| සේවක වර්ගය | අනුමත | තථ්‍ය | ඌණතාවය |
|---|---|---|---|
| විධායක මට්ටම | 01 | - | 01 |
| ද්විතීය මට්ටම | 16 | 12 | 04 |
| තෘතීය මට්ටම | 23 | 12 | 11 |
| වෙනත් | 40 | 24 | 16 |

(අ) වර්ෂ 07 කට අධික කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවති කළමනාකරණ සේවා අධි ශ්‍රේණියේ 1 වැනි පන්තියේ තනතුර සඳහා පත්වීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂයක් සහ වර්ෂ දෙකක කාලයක සිට පුරප්පාඩුව පැවති කළමනාකරණ සේවා 111 සහ 11 පන්තියේ තනතුරු 04 ක් සහ සුළු සේවක තනතුරු 03 ක් සඳහා පත්වීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

5. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

ඝණ අපද්‍රව්‍ය රැස්කරනු ලබන ස්ථානය වටා වැටක් සෑදීම සඳහා 2011 නොවැම්බර් 22 දින රු.1,345,000 ක් වටිනා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ගිවිසුම අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරු විසින් ඉදිකරනු ලද වර්ග අඩි 177 ක් වූ වැට හඳුනා නොගත් පුද්ගලයන් විසින් ඉවත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) කම්බි දැල වැට ඉදිරිපස යොදන ලද කොන්ක්‍රීට් කණු කැඩී තිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය රැස්කරනු ලබන මධ්‍යස්ථානයේ පොළවට බොරළු අතුරා තැලීම සඳහා රු.143,000 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද එසේ තලා නොතිබීම නිසා පොළවෙහි වලවල් රාශියක් සෑදී තිබුණි.

6. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

-----------------------------------------------

6.1 අභ්‍යන්තර විගණනය

----------------------------

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අංක 03 සහ 2005 නොවැම්බර් 08 දින දරන චක්‍රලේඛයෙහි 08 වැනි ඡේදය ප්‍රකාරව සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවිය යුතුය. නමුත් සභාව විසින් අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

7. පද්ධති සහ පාලන

--------------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය

(අ) ගිනුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) අයවැය ලේඛණමව පාලනය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය